# දැදුරු ඔය මධ්‍යය නිම්නය ආශ්‍රිතව නිර්මාණය වූ ප්‍රාදේශීය පාලන ඒකක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ආරම්භයේ සිට දොළොස්වන සියවස දක්වා)

**වීරසිංහ ඩබ්.පී.ආර්.එම්.එස්.**[1]

ශ්‍රී ලංකාවේ සතර දිශාවන්ගේ ගලා බසින ගංගා හා ඔයවල් රාශියක් දක්නට ඇත. එහිදී දිගින් 147km ක් වන දැදුරු ඔය පුරාණ දක්ඛිණ දේශය වෙන් කරනු ලබන සීමාවයි. පාලි මූලාශ්‍ර වල ජජ්ජර නදිය නමින් හඳුන්වනු ලබන්නේ ද දැදුරු ඔයයි. දැදුරු ඔය වර්ෂය පුරාම ඒකාකාරි ලෙස ගලා බසින ගංගාවක් නොවේ. දිස්ත්‍රික්ක තුනක් හරහා ගලා බසින දැදුරු ඔය අතු ගංගාවන් කිහිපයකින් පෝෂණය වන ගංගාවකි. ප්‍රාදේශීය පාලන ඒකක නිර්මාණය වීම කෙරෙහි දැදුරු ඔය මධ්‍යය නිම්නයෙහි පිහිටීම බලපෑවේ කෙසේද? යන්න මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වේ. දැදුරු ඔය මධ්‍යය නිම්නය පදනම් කරගෙන බිහි වූ පාලන මධ්‍යස්ථාන මොනවාද යන්න හඳුනා ගැනීම  මෙම අධ්‍යයනයේ ප්‍රමුඛ අරමුණ විය. දැදුරු ඔය මධ්‍යය නිම්නයෙහි භූගෝලීය පිහිටීම පාලන මධ්‍යස්ථාන නිර්මාණය වීමට දායක වූ ආකාරය හඳුනා ගැනීම හා දැදුරු ඔය මධ්‍යය නිම්නයෙහි දේශපාලන තත්ත්වය හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ සෙසු අරමුණු විය. මෙම අධ්‍යයනය සඳහා ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය හෙවත් පුස්තකාල අධ්‍යයන ක්‍රමවේදය භාවිතා කරන ලදි. එහිදී ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර යොදා ගනිමින් පර්යේෂණය සිදු කරන ලදි. දැදුරු ඔය මධ්‍යය නිම්නය ආශ්‍රිත ප්‍රදේශය ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන්ම ජනාවාසකරණයට ලක් වූ ප්‍රදේශයකි. මධ්‍යය නිම්නය භූගෝලීය අතින් තැනිතලා භූමියක් වන අතර කෘෂිකර්මාන්තය හා වාරිකර්මාන්ත ඉදිකිරීමට යෝග්‍ය පාංශු තත්ත්වයක්ද ඇත. දැදුරු ඔය මධ්‍යය නිම්නයෙහි ප්‍රාග් ඓතිහාසික අවධියේ පටන්ම ජනාවාසකරණයට ලක් වූ ප්‍රදේශයක් වීම විශේෂ ලක්ෂණයකි. පූර්ව ඓතිහාසික අවධිය වන විට ජනපද රැසක් බිහිවීම දක්නට ලැබේ. එහිදී පසුකලීන වන්නට දැදුරු ඔය මධ්‍යය නිම්නය මුල් කර ගෙන ප්‍රාදේශීය පරිපාලන ඒකක ගොඩ නංවා ඇත. පරාක්‍රමපුර, නුවරකන්ද, යාපහුව වැනි පරිපාලන මධ්‍යස්ථාන දැදුරු ඔය මධ්‍යය නිම්නයෙහි ස්ථාපිත කර ඇත. පුරාණ දක්ඛිණ දේශයේ අගනගරය වූයේද පරක්‍රමපුර නැතහොත් පඬුවස් නුවරයි. දැදුරු ඔය මධ්‍යය නිම්නය තැනිතලා භූමියක් වීමත්, හුදෙකලාභාවයකින් යුක්ත වීමත්, අරක්ෂිත ප්‍රදේශයක් වීමත් ප්‍රදේශීය පරිපාලන ඒකක ගොඩ නැගීමට හේතු වන්නට ඇතැයි නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද** : පරාක්‍රමපුර, නුවරකන්ද. යාපහුව, දැදුරු ඔය, ජනාවාසකරණය

[1]ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. rohanmayurasampthweerasinghe@gmail.com